රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක
இல.
No. 46

# රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවන්හි අනියම් සේවකයෝ

# அரசாங்கத் திணைக்களங்களிலும் யாக்கங்களிலும் உள்ள அமயப் பணியாளர்கள்

# Casual Employees in Government Departments and Corporations

ආයතන චක්‍රලේඛ මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No. 36

රජයේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

මිළ ගණන Price : -/20 තැපැල් ගාස්තුව தபாற் செலவு Postage : -/15

සියලු ස්ථිර ලේකම්වරුන් හා

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවන්හි අනියම් සේවකයෝ**

රජයේ දෙපාර්තමේන්තුවල හා රජයේ අනුග්‍රහයෙන් පවත්නා මණ්ඩලවල හා සංස්ථාවන්හි අනියම් සේවකයින් සම්බන්ධයෙන් රජය පහත සඳහන් තීරණ කර තිබේ :—

1 : 1. එක් එක් රජයේ දෙපාර්තමේන්තුව හා එක් එක් ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාව අඛණ්ඩ දීර්ඝකාලීන පදනමක් මත නොකඩවා පවත්නා වැඩවල ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් වෙමින්, තම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් ශ්‍රේණියකින් අවශ්‍ය ස්ථිර සේවක සංඛ්‍යාව වරින් වර නියම කර ගත යුතුය.

1 : 2. ස්ථිර සේවක සංඛ්‍යාව නියම කිරීම කළපසු, දැනට සේවයේ සිටින සුදුසු අනියම් සේවකයන්, අවුරුදු 3ක අවම සේවා කාලයක් ඔවුන්ට ඇත්නම් හා ඔවුන්ගේ වැඩ, පැමිණීම සහ හැසිරීම ද සතුටුදායක වේ නම්, ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා අන්තර්ග්‍රහණය කළ හැකිය.

1 : 3. පුහුණු හා අඩ-පුහුණු කම්කරුවන් සම්බන්ධයෙන්, පුහුණු මිනිස් බලය පිළිබඳ දැනට පවත්නා හිඟය නිසා, (1 : 2) උපඡේදයෙහි දැක්වෙන අවම සේවා සුදුසුකම ලිහිල් කළ හැකිය.

1 : 4 ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරනු ලබන සියලුම අනියම් සේවකයන් දිවයිනේ කවර පළාතක හෝ සේවය කිරීමට සූදානම් විය යුතුය. මෙය ස්ථිර සේවක සංඛ්‍යාවට පත් කිරීම සඳහා එක් කොන්දේසියක් විය යුතුය.

1 : 5. නිශ්චිත යෝජනා ක්‍රමවල, තාවකාලික කටයුතුවල හෝ අවස්ථානුකූල කාර්යයක හෝ නියුක්ත කර සිටින අනියම් සේවකයන්ගේ සේවය, විකල්ප රැකීරක්ෂා අවස්ථාවන් ලබාගත නොහැකි වේ නම්, එම යෝජනා ක්‍රමය/කටයුත්ත/කාර්යය නිම කිරීමේදී/අත්හැර දැමීමේදී, ඒ කටයුතු නිම කිරීම සඳහා ගතවුණු කාලය ගැන නොසලකා, කෙළවර කළ යුතුය .

1 : 6. වාරවලදී සේවය අවශ්‍යවන (උදාහරණයක් වශයෙන් ගොවිපලවල) සේවකයන් සෑම අවස්ථාවලදීම නියුක්ත කරවීමට සිදුවන්නේ අනියම් පදනමක් මතය.

1 : 7. ඒ ඒ දෙපාර්තමේන්තුවල/සංස්ථාවල සේවකයන් ඵලදායක ලෙස නියුක්ත කරවනු ලැබීමට ඉඩ සැලසෙන පරිදි, ඉදි කිරීම් හා ගොඩනැගිලි කටයුතු අදාළ, සියළුම විශාල කොන්ත්‍රාත්තු එබඳු යෝජනා ක්‍රම මෙහෙයවීම සඳහා හැකියාවක් ඇති රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා වෙත හැකිතාක් දුරට පවරාදිය යුතුය.

2. ඉහත 1 : 1 ඡේදය අනුව ස්ථිර සේවක සංඛ්‍යා නියම කිරීමේදී රජයේ දෙපාර්තමේන්තු මහා භාණ්ඩාගාරයේ සැපයීම් හා සේවක සංඛ්‍යා අධ්‍යක්ෂ විමසා ඔහුගේ අනුමැතිය ලබාගත යුතුය.

3. කලින් අනියම් සේවය කර ඇති හෝ නැති තාවකාලික සේවකයන් ස්ථිර සේවක සංඛ්‍යාවේ පත්වීම් සඳහා කරන ඉල්ලීම් ඉහත කී අනියම් සේවකයින්ගේ ඉල්ලීම් සමගම සලකා බැලිය යුතුය.

4. ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරනු ලබන අනියම් හෝ තාවකාලික සේවකයින්ට, ඔවුන් පත් කරනු ලබන තනතුර හෝ ශ්‍රේණිය සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය අනුව එම තනතුර හෝ ශ්‍රේණිය සඳහා නියමිත අවම සුදුසුකම් තිබිය යුතුය.

5. මේ චක්‍රලේඛයේ 1 වැනි ඡේදයේ සඳහන් රජයේ තීරණ අවශ්‍ය කටයුතු සඳහා තම අමාත්‍යාංශය යටතේ ඇති සියලු සංස්ථා/මණ්ඩලවලට දැනගන්නට සලස්වන මෙන් ස්ථිර ලේකම්වරුන්ගෙන් ඉල්වනු ලැබේ.

(අ. ක.) බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

ආයතන අධ්‍යක්ෂ.

අංකය : 543ඊ 377 ඞී.
1972 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදීය.